ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී
ගෞරව උපාධි වැඩසටහන 2023/2024
6 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2024
ළමා අයිතිවාසිකම් - SNU6223/ESU4123
කාලය- පැය තුනයි. (03)

---

දිනය 2025.03.02 වේලාව - පෙ.ව. 09.30 - ප.ව. 12.30 දක්වා

---

01 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 02 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 01 - කොටස

01. යටත් විජිත සමයේදී ශ්‍රී ලාංකීය දරුවන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ලන්දේසීන් විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග පහක් (05) ලැයිස්තු ගත කරන්න.

02. "අයිතිවාසිකම් දරන්නා වශයෙන් ළමයාගේ පුද්ගල අනන්‍යතාව ළමා අයිතීන් පාලනය කෙරෙන ප්‍රධාන මූලධර්ම වලින් එකකි." සුදුසු උදාහරණ සහිතව මෙම සංකල්පය පැහැදිලි කරන්න.

03. විශේෂ තත්ත්වයන් යටතේ සිටින දරුවන්ගේ "ජීවත්වීමේ අයිතිය" ආරක්ෂා කිරීමට ප්‍රජාව මූලික කරගත් මැදිහත්වීම් පහක් (05) සඳහන් කරන්න.

04. විශේෂ තත්ත්වයන් යටතේ සිටින දරුවන් යන යෙදුම නිර්වචනය කර සමාජානුයෝජනයේදී එම දරුවන් මුහුණ දෙන අභියෝග තුනක් (03) ලැයිස්තු ගත කරන්න.

05. ළමා අපයෝජනයට හේතුවන සාධක තුනක් (03) නම්කර, ඒවායින් එකක් සුදුසු උදාහරණයන් දක්වමින් පැහැදිලි කරන්න.

06. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් තීරණාත්මක තොරතුරු බෙදා ගැනීමේදී තොරතුරු සැපයියයුතු පුද්ගලයන් මුහුණ දෙන අභියෝග තුනක් (03) ලැයිස්තුගත කර ඉන් එකක් උදාහරණයක් සමඟින් පැහැදිලි කරන්න.

07. විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීමට මාධ්‍යය මඟින් කලහැකි කාර්යයන් පහක් (05) සඳහන් කරන්න.

08. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් තුළ නිර්මාණශීලීත්වය පෝෂණය කිරීම සඳහා දෙමාපියන්ට නිවසේදී භාවිත කළ හැකි උපායමාර්ග තුනක් (03) නම් කරන්න.

(ලකුණු 05x08=40)

## 02 - කොටස

09. (i.) "සහභාගිත්ව අයිතිය" යන යෙදුම නිර්වචනය කරන්න. (ලකුණු 03)

(ii.) "විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ගේ සහභාගීත්ව අයිතිය බොහෝ විට නොසලකා හරිනු ලැබේ."
ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟවන්නේද?/ නොවන්නේද?
ඔබගේ පිළිතුර සාධාරණීකරණයට උදාහරණ තුනක් **(03)** සපයන්න.
(ලකුණු 07)

(iii.) විශේෂ අවශ්‍යතා ඇති දරුවන් පාසල් සන්දර්භය තුළදී තම සහභාගීත්ව අයිතිය උපරිමයෙන් අත්විඳීම සහතික කිරීමට ගුරුවරුන්ට ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාමාර්ග **පහක් (05)** විස්තර කරන්න. (ලකුණු 10)

10. (i.) "වර්ධනය හා සංවර්ධනය" යන යෙදුම් වලින් අදහස් කරන දේ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(ii.) විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ සමාජයීය සංවර්ධනය සඳහා වගකිවයුතු කාරක **තුනක් (03)** නම්කර විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සාමාජානුයෝජනයෙහි ලා ඒවායෙහි කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii.) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සමාජානුයෝජනයේදී ඉහත සඳහන් එක් නියෝජිතයෙකු මුහුණ දෙන අභියෝග **පහක් (05)** සඳහන් කර එම අභියෝග අවම කර ගැනීමට උපාය මාර්ග යෝජනා කරන්න. (ලකුණු 10)

11. "ළමා ආරක්ෂාව තහවුරු කිරීම පවුල, පාසල, ප්‍රජාව සහ රජයේ හවුල් වගකීමකි."

(i.) ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCRC) මඟින් දක්වා ඇති පරිදි "ආරක්ෂාව සඳහාවන අයිතිය" යන යෙදුම නිර්වචනය කරන්න.
(ලකුණු 04)

(ii.) විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ ආරක්ෂාව සඳහා වන අයිතිය සහතික කිරීම සඳහා වඩාත් ආරක්ෂාකාරී සහ අන්තර්කරණ පරිසරයක් පාසල තුළ නිර්මාණය කර ගැනීමට ක්‍රමවේද **තුනක් (03)** සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii.) විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ ආරක්ෂාව සඳහා වන අයිතිය කෙරෙහි සමාජ ආකල්ප සහ සමාජ මත බලපාන්නේ කෙසේදැයි විභාග කරන්න.
(ලකුණු 10)

12. (i.) "දරුවාගේ උපරිම යහපත" යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද සහ ළමා අයිතීන් සුරැකීමට එය වැදගත් ඇයි දැයි සඳහන් කරන්න. (ලකුණු 03)

(ii.) තම පන්තියේ සිටින ඩවුන් සින්ඩ්‍රෝම් (Down Syndrome) තත්ත්වය සහිත දරුවකු ලිංගික අපයෝජනයකට පත්වන බවට සැක සහිත අවස්ථාවක, දරුවාගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සහතික කිරීම වෙනුවෙන් ගුරුවරයකු ලෙස ඔබට ගතහැකි නිශ්චිත පියවර ලැයිස්තුගත කර පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii.) ශ්‍රී ලංකාවේ ළමා අපයෝජන අවම කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා සමාජ මාධ්‍ය භාවිත කළ හැකි ක්‍රම **හතරක් (04)** උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
(ලකුණු 09)



22

13. (i.) ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුවේ ප්‍රධාන කාර්යයන් තුනක් **(03)** ලැයිස්තු ගත කරන්න. (ලකුණු 03)

(ii.) "ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුම් අත්සන් කර ඇතත් ඒවා සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම තවමත් අභියෝගයකි." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකග වන්නේද? නොවන්නේද? උදාහරණ දක්වමින් ඔබේ පිළිතුර සනාථ කරන්න. (ලකුණු 07)

(iii.) ජාතික ළමා අයිතිවාසිකම් ප්‍රතිපත්තියක් සැකසීමේ වගකීම ඔබට පැවරී ඇතැයි සිතන්න.
එය සකස් කිරීමේදී ඔබ ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් **(03)** හඳුනාගෙන, දරුවන්ගේ ආරක්ෂාව හා යහපැවැත්ම සහතික කිරීමට ඒ සෑම ක්ෂේත්‍රයක්ම වැදගත්වන්නේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

14. (i.) දරුවන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව ඉගැන්වීමට, ඵලදායි ක්‍රම තුනක් **(03)** ලැයිස්තු ගත කර තම අයිතිවාසිකම් පිළිබඳව දරුවන් දැනුවත් කිරීමට ඔබ ඒවා යොදා ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය ගුරුවරු විසින් තහවුරු කරන්නේ කෙසේද? ඵලදායි උපාය මාර්ග තුනක් **(03)** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(iii.) විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය තහවුරු කිරීමේදී ඇතිවන බාධා තුනක් **(03)** ලැයිස්තුගත කර ඒවා අවමකර ගැනීමට යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*